**කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා මෙහෙයුම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------------ | ----------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේදී රු.5,040,553 ක් වැය කර ප්‍රාදේශීය සභා පුස්තකාලයේ ඉහළ මහල ඉදිකිරීමේ වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | පසුගිය වර්ෂය අවසානයට ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලස්වා නොතිබූ ගෙවිය යුතු වියදම රු.1,312,783 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට ණයහිමි ශේෂය රු.1.109,925 වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | ------------------------- | ---------- |
| හිමිකම් ඔප්පු, තක්සේරු වාර්තා, පිඹුරුපත්, විස්තරාත්මක උපලේඛන ආදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.58,247,274ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ------------------ | ------------------ | ----------------------- | ------------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>----------------- | | | |
| | (i) මු.රෙ.272.1 | සභාව විසින් පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුමෙන් ගෙවන ලද රු.427,020ක් වටිනා ගෙවීම් වවුචරය අස්ථානගතවීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එකඟ වන බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) මු.රෙ.571 | වසර 02 ක කාලය ඉකුත් වූ රු.104,342 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.4,683,492 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.515,070 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,025,485 | 922,123 | 828,320 | 808,959 | 879,515 | 904,072 | 951,991 | 715,156 |
| (ii) | කුලී | 4,915,200 | 1,643,740 | 1,643,524 | 376,498 | 1,591,800 | 1,580,920 | 1,538,572 | 376,282 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 330,100 | 484,510 | 543,360 | 38,325 | 130,000 | 117,000 | 117,000 | 97,175 |
| (iv) | වෙනත් ආදායම් | 7,798,200 | 94,600 | 11,564,821 | 660,146 | 6,520,000 | 7,789,310 | 2,210,000 | 12,130,367 |
| | | 14,068,985 | 3,144,973 | 14,580,025 | 1,883,928 | 9,121,315 | 10,391,302 | 4,817,563 | 13,318,980 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.715,156 ක් වූ අතර, වර්ෂය අවසානයට එම ශේෂය රු.808,959 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වන වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන 2020 ජනවාරි 31 දිනැති අංක 2161 ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කර, වරිපනම් බදු අයකිරීම සඳහා 2021 ඔක්තෝබර් 05 දින සභා සම්මත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වරිපනම් දේපළ තක්සේරු කර වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දේපල තක්සේරු කර ගැනීම සඳහා පළාත් ආණ්ඩුකාරවරයාගෙන් අනුමැතිය ලබා ගෙන කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානය වන විට සභාව සතු කඩ කුලී ගෙවන කඩ කාමර 10 කට හා බිම් බදු ගෙවන කඩ කාමර 06 කින් රු. 184,996 ක හිඟ ආදායම් අය විය යුතුව තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඈ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ 06 වන ඡේදය ප්‍රකාරව 2022 නොවැම්බර් 30 දින වන විට සභාව සතු කිරින්ද පොදු වෙළෙඳපොළ නව වෙළෙඳ සංකීර්ණයේ හා බස් නැවතුම්පොළ පිහිටි කඩකාමර 32 ක බදු මුදල් තක්සේරු කර නොතිබුණි. | තක්සේරු කටයුතු කඩිනමින් අවසන් කර ගැනීමට හැකි වන බව. | කඩිනමින් කඩ කුලී තක්සේරු යාවත්කාලීන කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (viii) උප වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුළ ගොඩනැඟිලි, ගොඩනැඟිලි තැනීම හා වැඩ කටයුතු සම්බන්ධයෙන් සැලසුම් හා සංවර්ධන රෙගුලාසි ඇතුළත් අතුරු ව්‍යවස්ථාව පනවා ගෙන නොතිබූ අතර 2022 දෙසැම්බර් 06 දින නියැදි ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී අනුමැතියකින් තොරව සිදු කර තිබූ ඉදිකිරීම් 06 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා කෙටුම්පත සහ ඊට අදාල ආකෘතිපත් මේවනවිට සකස් කරමින් පවතින බවත්, ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී හඳුනා ගෙන තිබූ ඉදිකිරීම් 06 ට අදාලව අනුමැතිය සනාථ කළ හැකි ලේඛන සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ලිඛිතව දැනුම් දී ඇති බවත් ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශයට අයත් නාගරික සීමාව ඇතුළත අලුතින් ඉදිකර තිබූ හෝ ඉදිකරමින් පැවති ගොඩනැගිලි 06 ක් සඳහා සංවර්ධන බලපත්‍ර ලබා නොගෙන ඉදිකිරීම් කර තිබූ අතර නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග / රෙගුලාසි ඇතුලත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ විධිවිධාන ප්‍රකාර සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාළ ගොඩනැගිලි සඳහා අනුමැතිය ලබා ගෙන තිබේ ද යන්න සනාථ කළ හැකි ලේඛන සභාව වෙත කඩිනමින් ඉදිරිපත් කරන ලෙස අදාළ ඉදිකිරීම්කරුවන් වෙත ලිපි යොමු කර ඇති බවත් ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සංවර්ධන බලපත්‍ර 186 ක් ලබා දී තිබුණද අනුකූලතා සහතික ලබා ගෙන තිබුණේ ගොඩනැගිලි 31 ක් සඳහා පමණි. | අනුකූලතා සහතික ලබා නොගත් ගොඩනැගිලි බලපත්‍රහිමියන් වෙත එම සහතිකය කඩිනමින් ලබා ගන්නා ලෙසත්, ඉදිකිරීම් තවම නිම නොවූ නිවාසහිමියන් වෙත නාගරික සංවර්ධන අධිකාරි පනත ප්‍රකාරව ගොඩනැගිලි බලපත්‍රය දීර්ඝ කර ගැනීමට කටයුතු කරන ලෙසත් ලිඛිතව දැනුම් දී ඇති බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ PR/01/01 හා 2010 අගෝස්තු 17 දින දරන චක්‍රලේඛය ප්‍රකාරව වීථි ලාම්පු ස්ථාපනය නොකිරීම හේතුවෙන් සභා අරමුදලින් රු.211,935 ක වියදමක් ප්‍රතිපූර්ණය වී නොතිබුණි. | ඉල්ලීම් කළ ද මුදල් නොලැබුණු බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු ත්‍රිරෝද රථය අලුත්වැඩියාව සඳහා රු.194,550 කට අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනයෙන් අලුත්වැඩියා නොකර ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශයක් නොමැතිව රු.216,800 ක වැඩි මිලක් ඉදිරිපත් වූ ආයතනයෙන් අලුත්වැඩියාව සිදු කර තිබුණි. | අලුත්වැඩියාවට ගත වන කාලය හා අවසන් කර ලබා දිය යුතු කාලය සහ අදාළ ආයතනයට ඇති විශේෂඥතාවය යන කරුණු මත පෞද්ගලික ආයතනයක් විසින් ඉදිරිපත් කර තිබූ මිල ගණන් තෝරා ගන්නා ලද බව . | වඩා වාසිදායක මිල ගණන් තෝරා ගත යුතු වේ. |